# Rebuild Industries

පළමු වැනි කලාපය

## වසර 14කට පසු "ශ්‍රී ලංකා EXPO 2026" ජුනි මස කොළඹ දී



ශ්‍රී ලංකාවේ අපනයන විභවයන් සහ ආයෝජන අවස්ථා ලොවට විවෘත කෙරෙන "ශ්‍රී ලංකා EXPO 2026" ජාත්‍යන්තර ප්‍රදර්ශනය එළඹෙන ජුනි මස 18 වැනි දා සිට 21 වැනි දා දක්වා කොළඹ BMICH හිදී පැවැත්වේ. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම මත අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් මෙය සංවිධානය කරනු ලබයි.

වසර 14කට පසු පැවැත්වෙන මෙම දැවැන්ත ප්‍රදර්ශනයේ මූලික ඉලක්කය වන්නේ 2030 වසර වන විට මෙරට අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 36ක ජාතික ඉලක්කයක් කරා රැගෙන යාමයි. මේ සඳහා ඇඟලුම්, තේ, මැණික්, තොරතුරු තාක්ෂණය ඇතුළු ක්ෂේත්‍ර 24ක් නියෝජනය කරමින් දේශීය අපනයනකරුවන් 750ක් සහ ජාත්‍යන්තර ගැනුම්කරුවන් හා ආයෝජකයින් 1,500ක් සහභාගී වීමට නියමිතය. ව්‍යාපාරික හමුවීම් (B2B), ආයෝජක සංසද සහ විලාසිතා සංදර්ශනවලින් සමන්විත මෙමඟින් ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ ප්‍රධාන වෙළෙඳ හා ආයෝජන මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂිතය.

### 2030 වනවිට ඩොලර් බිලියන 36ක ආර්ථිකයකට ළඟාවීම අපේ ඉලක්කයයි



අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය


SRI LANKA expo 2026
Island with Infinite Opportunities

තව දින 117
මේ ගැන දැන ගන්න https://srilankaexpo.lk/ වෙත පිවිසෙන්න.


e පුවත්පත සඳහා පිවිසෙන්න

## දැක්ම

තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම.

## මෙහෙවර

තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුළින් විවිධාංගීකරණය වූ ඉහළ අගය එකතු කළ නව්‍ය කාර්මික නිෂ්පාදන පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය ඉහළ වෙළෙඳපොළ ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම.

## අරමුණු

- 2024 වසරේ 26.7%ක් වූ දළ දේශීය නිෂ්පාදිතය සදහා කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 28% දක්වා වැඩි කිරීම.
- 2024 වසරේ 16.4% වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 20%ක් දක්වා වැඩි කිරීම.
- 2023 වසරේ 3.2%ක් වූ ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය 2030 වසර වන විට 10%ක් දක්වා ඉහළ නැංවීම.
- 2024 වසරේ ඇමරිකානු ඩොලර් බිලියන 12.7ක් වූ කාර්මික (වෙළඳ භාණ්ඩ) අපනයනය 2030 වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන 28 දක්වා වැඩිකිරීම.
- 2023 වසරේ 0.01%ක් වූ කර්මාන්ත කටයුතු සඳහා වෙන් කළ ඉඩම් ප්‍රමාණය 2030 වසර වන විට 1% දක්වා වැඩි කිරීම. (ජාත්‍යන්තර සම්මතය 3%)



2030 වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන 36ක අපනයන ආදායමක් ලබා ගැනීමේ ජාතික ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා කර්මාන්තකරුවන් බලගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන අතර රාජ්‍ය, පුද්ගලික සහ මහජනතාව (3Ps) යන අංශ තුන ම සහභාගීත්වයෙන් කර්මාන්ත ආර්ථිකයක් බිහිකිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

**සුනිල් හඳුන්නෙත්ති**
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය



රජයේ ප්‍රතිපත්ති සහ පුද්ගලික අංශයේ හැකියාවන් එකිනෙක සම්බන්ධ කර ගනිමින් රටේ දිගු කාලීන තිරසාර ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම රජයේ අපේක්ෂාවයි. විශේෂයෙන් විදේශ ආයෝජන දිරිමත් කිරීමට අවශ්‍ය සුදුසු පරිසරයක් මේ වන විට සකස් කර තිබෙනවා.

**චතුරංග අබේසිංහ**
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය



කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඵලදායිතාවය ඉහළ නැංවීමෙන් රටේ ආර්ථික ඉලක්කයන් වෙත පහසුවෙන් ළඟා වීමේ හැකියාව තිබෙනවා. පසුගිය වකවානුවේ රටේ පැවති විවිධ බිඳ වැටීම් හමුවේ වුව ද කර්මාන්තකරුවන් රටේ ආර්ථිකයට ලබාදුන් සුවිශාල අඛණ්ඩ දායකත්වය අගය කරන අතර ඔවුන් තවදුරටත් සවිබල ගැන්වීමට කර්මාන්ත අමාත්‍යාංශය කටයුතු කරනවා.

**තිලකා ජයසුන්දර**
ලේකම් - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

# 2025 වසරේ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී ජයග්‍රහණ

ලෝක වෙළඳපොළ ජය ගනිමින් ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ජාත්‍යන්තරයට රැගෙන ගිය 2025 වසර මෙරට අපනයන ක්ෂේත්‍රයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත. ආර්ථිකයේ ස්ථාවරත්වය මෙන් ම නිෂ්පාදකයන්ගේ කැපවීම විදහා දක්වමින් ලැබූ එම ජයග්‍රහණ මෙසේ පෙළගැස්විය හැකිය.

- ඉතිහාසයේ ඉහළම අපනයන අගය ලෙස ඇමරිකානු ඩොලර් බිලියන 17.3ක සමස්ත අපනයන ආදායමක්
- පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ 42%ක වර්ධනයක් සමඟින් ඇමරිකානු ඩොලර් බිලියන 1.2ක වාර්තාගත අපනයන ආදායමක්
- ආහාර සහ පාන කර්මාන්ත අපනයන ක්ෂේත්‍රයේ 24%ක කැපී පෙනෙන වර්ධනයක්
- ඇඟලුම් අපනයන ක්ෂේත්‍රයේ 5%ක වර්ධනයක්

ලෝක වෙළඳපොළ තුළ ශ්‍රී ලාංකේය නිෂ්පාදන කෙරෙහි ඇති විශ්වාසය තහවුරු වූ මෙම වසර ඉදිරි දශකයේ ආර්ථික පුනරුදයට මනා පිටිවහලක් සපයයි.



# 2030 වනවිට ඩොලර් බිලියන 36ක ආර්ථිකයකට ළඟාවීම අපේ ඉලක්කයයි

අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය



**ආර්ථික අර්බුදයෙන් පසු රට නැවත ගොඩනැගීමේ ප්‍රධානතම මෙහෙයුම දියත් වන්නේ දේශීය කර්මාන්ත සහ ව්‍යවසායකත්වය කේන්ද්‍ර කරගනිමිනි. රාජ්‍ය කර්මාන්ත පද්ධතියට නව පණක් ලබා දෙමින් අපනයන වෙළෙඳපොළ ජය ගනිමින් නිෂ්පාදන ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව ගෙන යන නව වැඩපිළිවෙළ පිළිබඳව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යවරයා සමඟ කළ විශේෂ සම්මුඛ සාකච්ඡාවකි.**

**■ පසුගිය වසරක කාලය තුළ කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රගතිය සහ අමාත්‍යාංශයේ ව්‍යුහාත්මක වෙනස්කම් ඔබ දකින්නේ කෙසේද?**

ඇත්තටම 2025 සාර්ථක වසරක් ලෙස මම දකිනවා. අපි භාරගත්තේ බිඳ වැටුණු ආර්ථිකයක්. එවැනි වටපිටාවක කර්මාන්ත පද්ධතිය නැවත පණ ගැන්වීමට අපි විද්‍යාත්මක ප්‍රවේශයක් ගත්තා. එහි විශේෂ ම පියවරක් තමයි කර්මාන්ත ක්ෂේත්‍රයට සෘජුව ම සම්බන්ධ IDB, EDB, NEDA සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය යන ප්‍රධාන ආයතන එකම අමාත්‍යාංශයක් යටතට ගෙන ඒම. මේ ඔස්සේ වඩාත් කාර්යක්ෂම මෙහෙයුම් පද්ධතියක් ගොඩනැගුණා. ඒ වගේම විවිධ ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි උපදේශක සභා 26ක් පිහිටුවා කර්මාන්තකරුවන් මුහුණ දෙන ප්‍රායෝගික ප්‍රශ්නවලට සෘජුවම විසඳුම් ලබා දීමට අපට හැකි වුණා.

**■ "දිට්වා" සුළි කුණාටුව නිසා හානියට පත් ව්‍යවසායකයින් වෙනුවෙන් අමාත්‍යාංශය ගෙන ඇති සහන සහ මැදිහත්වීම් මොනවාද?**

ස්වභාවික ආපදා හමුවේ අසරණ වන ව්‍යවසායකයන් වෙනුවෙන් අපි වගකීමෙන් පෙනී සිටිනවා. ආපදාවෙන් පසු අපි ඉතා ඉක්මනින් දත්ත පද්ධතියක් සකස් කර හානියට පත් 30,000කට අධික පිරිසක් ලියාපදිංචි කළා. ඔවුන්ට යළි තම ව්‍යාපාර ආරම්භ කිරීමට මූලික දීමනාවක් ලෙස රුපියල් ලක්ෂ දෙක බැගින් ලබා දීමට අපි කටයුතු කරනවා. ඊට අමතරව ඔවුන්ගේ මූල්‍ය බර ලිහිල් කිරීම සඳහා අයවැය මගින් රුපියල් බිලියන 80ක ඇවැන්ත ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙනවා. එමගින් බැංකු ණය සහන සහ රක්ෂණ වන්දි කඩිනම් කිරීමේ විශේෂ පැකේජයක් අපි ක්‍රියාවට නංවා තිබෙනවා.

**■ මෙරට අපනයන ක්ෂේත්‍රයේ වත්මන් තත්ත්වය සහ ඉදිරි වසර කිහිපය සඳහා ඔබ සතු ඉලක්ක මොනවාද?**

අපනයන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වර්ධනයක් මේ වන විට පෙන්නුම් කරනවා. අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 17ක් දක්වා ඉහළ නංවා ගැනීමට අපට හැකි වී තිබෙනවා. අපේ ඊළඟ ඉලක්කය වන්නේ 2026 වන විට එය ඩොලර් බිලියන 20 දක්වාත්, 2030 වන විට ඩොලර් බිලියන 36 දක්වාත් වර්ධනය කිරීමයි. මේ සඳහා අපි ඉතා ක්‍රමවත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. වසර 28කට පසුව "අන්තර් අමාත්‍යාංශ අපනයන සභාව" පිහිටුවීම මෙහිදී ඉතා වැදගත්. එමගින් විවිධ අමාත්‍යාංශ අතර පවතින ගැටලු නිරාකරණය කරමින් අපනයනකරුවන්ට ඇති බාධා ඉවත් කිරීමට අපි නිරන්තරයෙන් මැදිහත් වෙනවා.

**■ අකර්මණ්‍ය වූ රාජ්‍ය කර්මාන්ත පද්ධතිය යළි පණගැන්වීම සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති සැලසුම් සහ එහි ප්‍රගතිය කෙබඳුද?**

වීඩියෝව නැරඹීමට QR කේතය Scan කරන්න

දේශීය සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම අපේ ප්‍රතිපත්තියයි. ඒ යටතේ වසර 40ක් තිස්සේ වසා දමා තිබූ පරන්තන් කෙමිකල් ආයතනය රුපියල් බිලියන 1.1ක ආයෝජනයකින් අපි යළි ආරම්භ කරනවා. ඒ වගේම එප්පාවල පොස්පේට් ව්‍යාපෘතියේ නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට බාධාවක්ව පැවති දීර්ඝකාලීන නීතිමය ප්‍රශ්න අපි නිරාකරණය කළා. වාලච්චේන කඩදාසි කර්මාන්තශාලාව ද මේ වන විට පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක වීමට අවශ්‍ය කටයුතු සලසා තිබෙනවා. මේ සියලු පියවර ගත්තේ රටේ මුදල් පිටරට ට යැම නතර කර දේශීය නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමටයි.

**■ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමට සහ ක්ෂේත්‍රයට අලුතින් පිවිසෙන පිරිස් මෙන්ම ආයෝජකයින් දිරිමත් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?**

අපි ව්‍යවසායකත්වය පිළිබඳ සංස්කෘතිකමය වෙනසක් ඇති කිරීමට උත්සාහ කරනවා. ඒ නිසාම පාසල් පද්ධතියේ 6 වසරේ සිට ම ව්‍යවසායකත්වය විෂයක් ලෙස හඳුන්වා දීමට අපි පියවර ගත්තා. නව ආයෝජකයන් මුහුණ දෙන ගැටලු ඉවත් කර පහසුකම් සැලසීම සඳහා "Industry Facilitation Centre" එකක් සහ නවීන ඩිජිටල් පද්ධතියක් අපි ස්ථාපිත කරනවා. එසේ ම එළැඹෙන ජූනි මස දී පවත්වන "Expo 2026" ප්‍රදර්ශනය අපට ඉතා වැදගත්. ඒ හරහා විදේශීය ගැනුම්කරුවන් 1500කට අධික පිරිසකට මෙරට ආයෝජන අවස්ථා විවර කර දීමටත් දේශීය නිෂ්පාදන ජාත්‍යන්තරයට ගෙන යැමටත් අපි සූදානම්.

**■ නිෂ්පාදන ආර්ථිකයක් කරා යන මේ ගමන සහ 2026 වසරේ අපේක්ෂිත ජයග්‍රහණ ගැන ඔබ තුළ ඇති විශ්වාසය කෙබඳුද?**

මට ඉතා ම ඉහළ විශ්වාසයක් තිබෙනවා. අපේ මේ ගමන පුද්ගල කේන්ද්‍රිය දේශපාලනයක් නෙවෙයි. මෙය පැහැදිලි ප්‍රතිපත්ති මත පදනම් වූ විද්‍යාත්මක වැඩපිළිවෙළක්. දූෂණයෙන් තොර සහ පූර්ණ විනිවිදභාවයකින් යුතු පාලනයක් තුළ කර්මාන්තකරුවන්ට සහ ව්‍යවසායකයින්ට නිදහසේ වැඩ කළ හැකි පරිසරයක් අපි නිර්මාණය කර අවසන්. සෑම රුපියලකම වගකීම සහ වටිනාකම අපි ජනතාවට ලබා දෙනවා. 2026 වසර කියන්නේ මේ කැපවීම්වල සැබෑ ඵල නෙළා ගන්නා, ශ්‍රී ලංකාව කර්මාන්ත ලෝකයේ ස්ථාවර වන වසරක් බව මට විශ්වාසයි.

✍ ඉන්දීවරී මනුල වික්‍රම

Rebuild Industries

# ‘දිට්වා’ හමුවේ බිඳ වැටුණු කර්මාන්ත යළි දිනවන මාවත

**ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධනය සම්බන්ධයෙන් වගකීම් දරන ප්‍රධාන රාජ්‍ය ආයතනය වන කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය පසුගියදා ලංකාවට බලපෑ "දිට්වා" සුළිකුණාටුව සමඟ ඇති වූ ස්වභාවික ව්‍යසනය මත ආපදාවටපත් කර්මාන්ත හිමිකරුවන්ට සහන සැපයීම සඳහා අවශ්‍ය කඩිනම් මැදිහත්වීම සිදු කරන ලදී. ජාතික ආර්ථිකයට සැලකිය යුතු දායකත්වයක් දක්වන කර්මාන්ත ක්ෂේත්‍රය කඩිනමින් යළි නගා සිටුවීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම තුළින්, ආපදාවෙන් බිඳ වැටුණු ආර්ථිකය සහ ජන ජීවිතය යථාවත් කර ගැනීම සඳහා අවශ්‍ය සහය ලබාදීම අමාත්‍යංශයේ ප්‍රධානම අරමුණ විය.**

අමාත්‍යාංශය විසින් ආපදාවෙන් හානියටපත් කර්මාන්ත හිමිකරුවන් පිළිබඳ තොරතුරු රැස් කළ අතර අමාත්‍යංශය වෙත අයදුම්පත්‍ර 34,424 ක ප්‍රමාණයක් ලැබී තිබුනි. කඩිනම් සහන සැලසීම වෙනුවෙන් 071 2666660 හදිසි ඇමතුම් අංකය හඳුන්වාදුන් අතර ඉන් ආපදාවට ලක්වූ කර්මාන්ත යළි ආරම්භ කිරීමට අවශ්‍ය විදුලිය, ජලය, ඉන්ධන, ප්‍රවාහන සහ අනෙකුත් යටිතල පහසුකම් නැවත සපයා ගැනීමට අවශ්‍ය මූලික මැදිහත්වීම් මෙන්ම තොරතුරු පද්ධතියට අයදුම් පත්‍රයක් යොමුකිරීමට අවශ්‍ය තාක්ෂණික සහායද ලබා දෙනු ලැබීය.

මෙහිදී ආපදාවෙන් බලපෑමට ලක්ව ඇනහිට ඇති කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත්කිරීම සඳහා එක් වරක් පමණක් ගෙවනු ලබන ඒකකයට රු.200,000/= වන දීමනාව ගෙවීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශය විසින් මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට පියවර ගන්නා ලදී.

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය වන www.industry.gov.lk හරහා සහ දෘඪ අයදුම්පත් ලෙස යොමු වූ අයදුම්පත් අතරින් අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ පවතින අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය (NEDA), කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය (SED), ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS), ජාතික ශිල්ප සභාව (NCC), පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI) යන ආයතනයන්හි ලියාපදිංචි කර්මාන්ත හිමිකරුවන්ගේ අයදුම්පත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති අමාත්‍යාංශයේ නිලධාරීන් හරහා සත්‍යාපනය කර ගැනීමෙන් පසුව ගෙවීම් සඳහා තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සඳහා ලබාදීමට අවශ්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදෙනු ලැබීය.

මේ වනවිට ලැබී ඇති අයදුම්පත්‍ර අතරින් කර්මාන්ත හිමිකරුවන් 8,745 දෙනෙක් රු.200,000/- බැගින් වූ එක් වරක් පමණක් ලබාදෙන දීමනාව ලැබීමට සුදුසුකම් සපුරා ඇති බව හඳුනාගෙන ඇති අතර ඉන් කර්මාන්ත හිමිකරුවන් 7,630 දෙනෙක් සඳහා රු.1,526,000,000 /=ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබා දී තිබේ. ඉතිරි මූල්‍ය ප්‍රතිපාදන ඉදිරි සතිය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත ලබාදීමට අපේක්ෂිතය.

**ලක්ෂ්මී ද සිල්වා**
ප්‍රවෘත්ති නිලධාරී









තොරතුරු සම්පාදනය -
**පූර්ණිමා එන්. වික්‍රමරත්න**
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

Rebuild Industries



# ව්‍යවසායකයන්ගේ හෙට දවස වෙනුවෙන් අමාත්‍යාංශයෙන් "බිස්නස් කන්සල්ටන්ට්" බලකායක්





රාජ්‍ය සේවය යනු හුදෙක් කාර්යාල මේසයකට සහ ලිපිගොනුවලට සීමා වූවක් බවට වූ මතය දැන් අතීතයට එක් වෙමින් පවතී. කර්මාන්ත අමාත්‍යාංශය දියත් කළ නවතම 'සබඳතා නිලධාරී' (Relationship Officer) වැඩසටහන සමඟ රටේ සංවර්ධන නිලධාරියා යනු තවදුරටත් රජයේ නිවේදන බෙදාහරින්නෙකු පමණක් නොවේ. ඔහු ව්‍යවසායකයෙකුගේ සාර්ථකත්වය පසුපස හිඳින සැබෑ ව්‍යාපාරික උපදේශකයෙකි.

## ව්‍යවසායකයාගේ දෑත ශක්තිමත් කරන "සබඳතා නිලධාරියා"

අතීතයේ දී සිදුවූයේ යම් සහනයක් හෝ උදව්වක් පතා කාර්යාලයට පැමිණෙන මහජනයාට පමණක් සේවය සැලසීමයි. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය මෙම ක්‍රමවේදය උඩුයටිකුරු කරමින් දැන් නිලධාරියා ව්‍යවසායකයා සොයා ක්ෂේත්‍රයට යයි. "සබඳතා කළමනාකරණ" (Relationship Management) සංකල්පය රාජ්‍ය සේවයට බද්ධ කරමින් සෑම නිලධාරියෙකුටම ව්‍යවසායකයින් 5ක් හෝ 10කගේ වගකීම පවරා ඇත. වසර 3ක කාලයක් පුරා මෙම ව්‍යවසායකයින් සමඟ සමීපව කටයුතු කරමින් ඔවුන්ගේ ව්‍යාපාරික ඉලක්ක (KPIs) හඹායාමට මඟ පෙන්වීම නිලධාරියාගේ නව රාජකාරියයි. ව්‍යාපාරයක සේවක සංඛ්‍යාව ඉහළ නැංවීම, පිරිවැටුම වැඩි කිරීම සහ මූල්‍ය විනය පවත්වා ගැනීම වැනි කරුණු මෙහිදී සෘජුවම අධීක්ෂණය කෙරේ.

## SLIM සමඟ එක්ව ලැබෙන වෘත්තීය පරිවර්තනය

මෙම සුවිශේෂී පරිවර්තනය හුදෙක් නම වෙනස් කිරීමකින් පමණක් සිදු වූවක් නොවේ. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සමඟ එක්ව මෙම නිලධාරීන් සඳහා ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය පුහුණුවක් ලබා දේ. මෙය අදියර තුනකින් සමන්විත දැනුම බෙදාදීමේ සංග්‍රාමයකි.

### පළමු අදියර:

සබඳතා නිලධාරී (Relationship Officer) ලෙස ව්‍යාපාරික සබඳතා ගොඩනැගීමේ පදනම.

### දෙවන අදියර:

සබඳතා විශේෂඥ (Relationship Specialist) ලෙස උපායමාර්ගික මැදිහත්වීම.

> සංවර්ධන නිලධාරියා හුදෙක් රජයේ නියෝජිතයෙකු නොව ඔබේ ව්‍යාපාරයේ සාර්ථකත්වය වෙනුවෙන් කැපවූ "සබඳතා හවුල්කරුවෙකි".

පදනම් ව්‍යාපාරික උපදේශක (Foundation Business Consultant) ලෙස වෘත්තීය උපදේශන බලකායකට එක්වීම.
පසුගිය වසරේ බස්නාහිර පළාතෙන් ඇරඹි මෙම මෙහෙයුම මේ වන විට නිලධාරීන් 600ක් පමණ පුහුණු කරමින් මුළු දිවයිනම ආවරණය කිරීමට සූදානම්ව පවතී.

## දේශීය සන්නාම ලොවට ගෙනයාම

ව්‍යවසායකත්වයේ දී අප අත්විඳින ප්‍රධානතම දුර්වලතාවක් වූයේ නිසි සන්නාමකරණය (Branding) පිළිබඳ දැනුම නොමැතිකමයි. මේ අඩුව පිරවීම සඳහා නිලධාරීන් "සන්නාම විශේෂඥයින්" (Brand Specialists) ලෙස පුහුණු කිරීමේ විශේෂ වැඩසටහනක් ද මීට සමගාමීව ක්‍රියාත්මක වේ. ඒ හරහා දේශීය නිෂ්පාදනවලට ගෝලීය වෙළඳපොළ ජයගත හැකි "සන්නාම අනන්‍යතාවක්" ලබාදීම අමාත්‍යාංශයේ අපේක්ෂාවයි.
මේ යටතේ ක්‍රියාත්මක වන "Level Up" වැඩසටහන මගින් ක්ෂුද්‍ර මට්ටමේ ව්‍යවසායකයින් සුළු හා මධ්‍ය පරිමාණ (SME) මට්ටම දක්වා ඔසවා තැබීමට අවශ්‍ය ශක්තිය සහ මෙවලම් (Tools) නිලධාරීන්ට ලබා දී ඇත.



**අනෝජා හේරත්**
අතිරේක ලේකම්
(ව්‍යවසායකත්ව සංවර්ධන)

## අනාගත රාජ්‍ය සේවයක අරමුණ

මෙම වැඩසටහන හුදෙක් පුහුණු පාඨමාලාවක් නොවේ. එය මෙරට කාර්මික සංස්කෘතියේ සිදුකරන මහා පරිමාණ වෙනසකි. අනාගතයේ දී පිහිටුවීමට නියමිත ඒකාබද්ධ ව්‍යවසායකත්ව සංවර්ධන ආයතනය තුළ මෙම නිලධාරීන් 'තාක්ෂණික බලකායක්' (Technical Cadre) ලෙස කටයුතු කරනු ඇත. ඔවුන්ට විශේෂ උසස්වීම් මාවතක් මෙන්ම සාර්ථකත්වය මත පදනම් වූ දිරිගැන්වීම් ලබා දීමටද සැලසුම් කර ඇත. කර්මාන්ත අමාත්‍යාංශය ගත් මෙම පියවර මගින් රටේ ආර්ථිකය යළි පණගැන්වීමට අවශ්‍ය 'ව්‍යාපාරික උපදේශකයින්' 600ක ගේ පෙරමුණක් දැන් නිර්මාණය වී හමාරය. එය දේශීය ව්‍යවසායකයාට පමණක් නොව සමස්ත ජාතික ආර්ථිකයටම මහත් ශක්තියකි.

✍ ඉන්දීවරී මනුල වික්‍රම

ඡායාරූපය - සුදත් නිශාන්ත

# ව්‍යවසායකයින්ට නව දිශානතියක්

**ශ්‍රී ලංකාවේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය නවමු මට්ටමකට රැගෙන යාමේ අරමුණින් අමාත්‍යාංශ ලේකම් ජේ. එම්. තිලකා ජයසුන්දර මහත්මියගේ සංකල්පයක් මත ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඒකාබද්ධව "4I ව්‍යාපෘතිය" නමින් ජාතික මට්ටමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරමින් පවතී. මෙම ව්‍යාපෘතිය යටතේ රට පුරා තරුණ ව්‍යවසායකයින් 1,000ක් ඵලදායිතා සංකල්ප උපයෝගී කර ගනිමින් සවිබලගැන්වීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.**

## ■ අරමුණ

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දැනුම, කුසලතා, ආකල්ප සහ තරගකාරීත්වය වර්ධනය කිරීම මගින් දේශීය මෙන්ම විදේශීය වෙළෙඳපොළ කොටස් වැඩිකර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම, නව කළමනාකරණ ක්‍රමවේද හඳුන්වා දීම, සුළු ව්‍යාපාර මධ්‍යම මට්ටමට හා මධ්‍යම ව්‍යාපාර මහා පරිමාණ මට්ටමට පරිවර්තනය කිරීම සඳහා සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු අතර වේ.

## ■ සුවිශේෂී බව

මනා පුහුණුවක්ලත් ඵලදායිතා නිලධාරීන් විසින් ව්‍යවසායකයින්ට අවශ්‍ය උපදේශකත්වය සපයනු ලබන අතර එක් එක් ව්‍යවසායකයා වෙන වෙනම නිෂ්පාදන, පාරිභෝගික, මානව සම්පත හා මූල්‍ය යන ප්‍රධාන පැතිකඩ ඔස්සේ අධ්‍යයනයන් සිදු කිරීම, ගැටලු හඳුනා ගැනීම හා විමසුම් සැපයීම සිදු කෙරේ. ඒ අනුව ව්‍යාපාර ප්‍රතිනිර්මාණ කරණය (Business Process Re-engineering) එහෙමත් නැත්නම් කළමනාකරණ ශිල්ප ක්‍රම උපයෝගී කර ගනිමින් දැනට පවත්නා ව්‍යාපාර තුළ ක්‍රියාවලි සංවර්ධනය කිරීම නොහොත් පවතින ක්‍රමය නිරන්තර අධීක්ෂණය කිරීම යටතේ උපදේශන ක්‍රමෝපායන් මගින් වසර 03ක කාලයක් පුරාවට උපදේශන සැසි, සහ වෙළෙඳපොළ සම්බන්ධතා වැඩසටහන් ලබා දීම මගින් ව්‍යාපාර ඵලදායිතාව වැඩි කරමින්, තත්ත්ව ප්‍රමිතීන් උසස් කිරීම සහ අපනයන හැකියා වර්ධනය කරමින් සුළු හා මධ්‍ය පරිමාන ව්‍යාපාර පුළුල් කර වැඩිදියුණු කිරීම මෙහි ඇති සුවිශේෂීත්වය වේ.

## ■ 4I

4I ව්‍යාපෘතිය ව්‍යාපාර සංවර්ධනයේ අත්‍යවශ්‍ය අදියර හතරක් මත පදනම් වේ. එනම්, Integrate (ඒකාබද්ධ කිරීම), Innovation (නව්‍යකරණය), Improvement (වැඩිදියුණු කිරීම) හා Implementation (ක්‍රියාත්මක කිරීම) යන සංකල්ප ඔස්සේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

## ■ අදියර දෙකක් යටතේ

නියමු ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කයෙන් ආරම්භ කර වසර 03ක් තුළ ව්‍යවසායකයන් 100කට ආසන්න පිරිසක් සංවර්ධනය කරන ලදී. මෙම නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වය ජාතික තලයට ගෙන යමින් 2025 වර්ෂයේ සිට දිස්ත්‍රික්ක 17ක් ආවරණය කරමින් ව්‍යවසායකයන් 504කට උපදේශකත්වය සපයන අතර 2026 වර්ෂය අවසාන වන විට සියලු දිස්ත්‍රික්ක ආවරණය කරමින් ව්‍යවසායකයන් සංඛ්‍යාව 1000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත.



**ජේ.එම්. තිලකා ජයසුන්දර**
ලේකම්
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය



**සුරංග ගුණරත්න**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

මේ සඳහා මෙම වසරේ මාර්තු මස දී පළ කරනු ලබන පුවත්පත් දැන්වීමට අනුව අයැදුම්පතක් යොමු කිරීමෙන් හෝ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය වෙත මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වීමට ඇති කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපියක් යොමු කිරීම මගින් මේ සඳහා සම්බන්ධ විය හැකියි.

## ■ කර්මාන්තකරුවන්ට ලැබෙන ප්‍රතිලාභ

ආයතනයේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම, ආයතනයේ මූල්‍ය විනය සහ මූල්‍ය පාලනය ඇති කිරීම, භාණ්ඩවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම, තරගකාරී වෙළෙඳපොළෙහි ස්ථාවරත්වයක් ඇති කර දීම, නව වෙළඳපල අවස්ථා (දේශීය/විදේශීය) සඳහා පෙළඹවීම, සේවකයන්ගේ කාර්යක්ෂමතාවය සහ චිත්ත ධෛර්යය වැඩිදියුණු කිරීම, සේවය අතහැර යාමේ ප්‍රතිශතය අවම කිරීම, සේවා ස්ථානයේ සුරක්ෂිතභාවය ඇති කිරීම, නව තාක්ෂණය හඳුන්වාදීම, නවමු අත්දැකීම් හුවමාරු කර ගැනීමේ හැකියාව හා ණය යෝජනා ක්‍රම හඳුන්වාදීමේ දී ප්‍රමුඛත්වය ලබා දීම වැනි ප්‍රතිලාභ රැසක් කර්මාන්තකරුවන්ට මෙමගින් හිමි වේ.

4I ව්‍යාපෘතිය හරහා ව්‍යවසායකත්වය ශක්තිමත් කරමින් නව රැකියා අවස්ථා රැසක් බිහි කිරීමත්, ජාතික ආර්ථිකයට දීර්ඝකාලීන දායකත්වයක් ලබා දීමත් අපේක්ෂා කරනු ලබයි.







✍ වින්ධ්‍යා පාදුක්කගේ

තොරතුරු සම්පාදනය -
උමාලි ප්‍රියදර්ශනී
සහකාර අධ්‍යක්ෂ - ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය

ඡායාරූපය -
තිලක් පෙරේරා

RebUild Industries

# ශ්‍රී ලංකාවේ සියලු ව්‍යාපාර එකම දත්ත පද්ධතියකට

## කර්මාන්ත අමාත්‍යාංශයෙන් නව පියවරක්

✍ අයි.එච්. ඉෂිනි උදරි

ශ්‍රී ලංකාවේ ආර්ථිකය නගා සිටුවීමේ ක්ෂේත්‍රයන් (Economic Activities) පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් දත්ත සමුදයක් (database) ලංකාවේ මෙතෙක් නොතිබුණි. එනම්, ලංකාව පුරා ව්‍යාප්තව පවතින සියලු ව්‍යාපාරයන්ගේ තොරතුරු එකම තැනක ඇතුළත් දත්ත පද්ධතියක් නොතිබූ අතර කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා පුරා ව්‍යාප්තව පවතින සියලු කර්මාන්තයන් එක තැනකට ගෙන එම සියලු ව්‍යාපාරයන් පිළිබඳ තොරතුරු ලබාගත හැකි පරිදි වෙබ් අඩවියක් අද වන විට නිර්මාණය කර ඇත. එනම්, https:// www.slenterprices.gov.lk වෙබ් අඩවියයි. මෙම වෙබ් අඩවිය මඟින් ලංකාවේ ආර්ථිකය නගා සිටුවීමට දායකවන සියලුම කර්මාන්තකරුවන්ට ලියාපදිංචි විය හැකිය.

2025 නොවැම්බර් මස ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතියේ මේ වනවිට ව්‍යාපාර 458ක් ලියාපදිංචි කර ඇති අතර ලියාපදිංචිය බලාපොරොත්තුවෙන් අධීක්ෂණ මට්ටමේ ව්‍යාපාර 3094ක් ඇත. වසර 03කින් පමණ ලංකාවේ සියලුම ආයතන මෙහි ලියාපදිංචි කරවීම කර්මාන්ත අමාත්‍යාංශයේ අරමුණයි.

මෙම වෙබ් අඩවිය තුළ ලියාපදිංචි විය හැකි ක්‍රමවේද දෙකකි. එනම් කර්මාන්ත අමාත්‍යාංශයේ පවතින ආයතන හරහා ලියාපදිංචි වීම හා සෘජුවම වෙබ් අඩවිය හරහා ලියාපදිංචි වීමයි. මෙලෙස වෙබ් අඩවිය තුළ ව්‍යාපාරයක් ලියාපදිංචි වීමේ දී කරුණු 106 අදාළ තොරතුරු ඉදිරිපත් කළ යුතුයි. එහිදී මූලිකව ආයතනයේ නම, ව්‍යාපාරයේ පාර්ශවකරුවන්ගේ නම් ඇතුළු මූලික තොරතුරු ඇතුළත් කළ යුතුය. ව්‍යාපාරයක් මෙලෙස ලියාපදිංචි වූ පසු අමාත්‍යාංශ නිලධාරියකු ලියාපදිංචිය තහවුරු කරනු ලබන අතර පසුව එම ව්‍යාපාරය පිළිබඳ තොරතුරු දත්ත සමුදයකට (database) ඇතුළත් කරනු ලබයි. මෙලෙස ව්‍යාපාරයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ පසු එම ආයතනය රජයේ ලියාපදිංචි ආයතනයක් ලෙස සලකන අතර එම ලියාපදිංචි ආයතනයට Digital Certificate එකක් ද නිකුත් කරනු ලැබේ. ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාරය කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කළ පසුව ISIC (International Standard Industrial Classification) හරහා එම ආයතනය ජාත්‍යන්තරව පිළිගත් කුමන ක්ෂේත්‍රයක පවතිනවා ද යන්න දැන ගත හැකි අතර විදේශ රටක ගැනුම්කරුවෙකුට වුවද එම ව්‍යාපාරයට අදාළ තොරතුරු ලබා ගැනීමෙන් පසුව ඔවුන්ගේ අවශ්‍යතාවය පරිදි භාණ්ඩ හා සේවා මිලදී ගත හැකිය.

ව්‍යාපාරයක් මෙලෙස කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වීම හරහා විශාල ප්‍රතිලාභ රාශියක් හිමිවේ. එනම් ව්‍යවසායකයන්ට රජයෙන් ලබාදෙන ප්‍රතිලාභ ලබාදිමේදී මෙම තොරතුර පද්ධතිය තුළ ලියාපදිංචි ව්‍යාපාරහට ප්‍රමුඛත්වය ලබාදෙයි. ඒ අනුව දිට්වා සුළි කුණාටුවෙන් හානි වූ ව්‍යාපාරිකයන්ට වන්දි මුදල් ලබාදීමේදී ද ප්‍රථමයෙන් එම වන්දි මුදල් හිමිවූයේ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යාපාර සඳහා ය.

එමෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ මෙම දත්ත පද්ධතිය පදනම් කර ගනිමින් පාරිභෝගිකයින්ට මෙන්ම අධ්‍යයන කටයුතුවල නිරත වන පර්යේෂකයන්ට ද තොරතුරු ලබා ගැනීමේ හැකියාව ඇත. ඒ අනුව ව්‍යාපාරයක් කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වීම තුළින් ව්‍යාපාරිකයන්ට මෙන්ම සමාජයට ද විශාල ප්‍රතිලාභ රාශියක් හිමි වේ.



දසුන් රාජපක්ෂ
අධ්‍යක්ෂ (කර්මාන්ත සංවර්ධන)

## ඔබේ කර්මාන්තය ලියාපදිංචි කර ගත්තද?



**ශ්‍රී ලංකාව කාර්මීකරණය කරා යන ගමනේ දී මෙරට සියලුම සුළු, මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ කර්මාන්ත හිමියන් සඳහා රජයෙන් පිරිනමන වරප්‍රසාද ලබා ගැනීමට දැන් අවස්ථාව ඇත.**

https://www.slenterprices.gov.lk






Rebuild Industries



**කේ.ඒ. සුභද්‍රා වල්පොල**
**අතිරේක ලේකම්**
**(සාම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධන)**






# අපේ පේෂකර්මාන්තයේ හරිත විප්ලවය

ශ්‍රී ලංකාවේ පේෂකර්මාන්ත ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් පර්යේෂණාගාර මට්ටමේ පවතින සොයා ගැනීම් ප්‍රායෝගික කර්මාන්ත අවශ්‍යතා සමඟ බද්ධ කළ තවත් එක් ව්‍යාපෘතියක් පසුගියදා සාර්ථකව නිම විය. ඒ කර්මාන්ත අමාත්‍යාංශය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය (National Design Centre) හා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) එක්ව ක්‍රියාත්මක කරන ලද "ශාකසාර අවශේෂ භාවිතයෙන් ස්වභාවික වර්ණක නිෂ්පාදන ක්‍රියාවලිය හඳුනා ගැනීමේ පර්යේෂණ ව්‍යාපෘතියයි" (Natural Dye Research Project). මෙහි ඇති විශේෂත්වය වන්නේ පේෂකර්මාන්ත ක්ෂේත්‍රය තුළ ස්වභාවික වර්ණක පිළිබඳ රජයේ මැදිහත් වීමෙන් මෙරට සිදුකරන ලද ප්‍රථම පර්යේෂණාත්මක ප්‍රයත්නය මෙය වීමයි. කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ මූල්‍ය දායකත්වය සහ අධීක්ෂණය යටතේ ජාතික මොස්තර මධ්‍යස්ථානය මඟින් ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතිය හරහා සාම්ප්‍රදායික පේෂකර්මාන්තය නවීන විද්‍යාවත් අතර මනා සහසම්බන්ධයක් ගොඩනැගීමට හැකි වී තිබේ.

වර්තමානය වන විට පාරිසරික තිරසාරත්වය පිළිබඳ සමස්ත ලෝකයේම අවධානය යොමු වී ඇති පසුබිමක රෙදිපිළි කර්මාන්තයේ දී භාවිත වන කෘත්‍රිම රසායනික වර්ණක, සායම් මඟින් ශරීර සෞඛ්‍යට, ජලජ පද්ධතිවලට සහ සමස්ත පරිසර පද්ධතියට සිදුවන හානිය බරපතළ ගැටලුවකි. එමෙන්ම රසායනික වර්ණක භාවිතයෙන් බතික් නිෂ්පාදන සිදු කිරීමේදී ඉවතලන අපද්‍රව්‍ය පිරිපහදු කිරීමේ ක්‍රියාවලියට අදාළව පාරිසරික බලපත්‍ර ලබා ගැනීමේදී බතික් කර්මාන්තකරුවන්හට ගැටළු සහගත තත්ත්වයන්වලට මුහුණ දීමට සිදුව ඇත. මෙවැනි අභියෝගවලට විසඳුම් සෙවීමේ අරමුණින් දියත් වූ මෙම පර්යේෂණයේ දී අපට පහසුවෙන් සපයාගත හැකි කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදනවල අතුරු ප්‍රතිඵලයක් ලෙස බැහැර කරන ද්‍රව්‍ය සහ ඉවතලන ශාකමය කොටස් මූලාශ්‍ර ලෙස භාවිත කරමින් වර්ණක නිස්සාරණය කිරීම (Extraction process) පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කෙරිණි. එහිදී ස්වාභාවික වර්ණක නිපදවීම පමණක් නොව ඒවායේ රසායනික ගුණාංග විශ්ලේෂණය කිරීම (Characterization of dye profile) සහ වර්ණවල ඒකාකාරී බවත් ස්ථායීතාවයත් (Color fastness) විද්‍යාත්මකව තහවුරු කිරීමට පර්යේෂණ කණ්ඩායම සමත් විය. මෙම තාක්ෂණික අභියෝග ජය ගැනීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) පර්යේෂණ කාර්යයේ දී සුවිශේෂී දායකත්වයක් ලබා දීම ද කැපී පෙනෙන කරුණකි.

මෙම ව්‍යාපෘතියේ සුවිශේෂී ම අංගය වන්නේ "පර්යේෂණාගාරයෙන් බතික් කර්මාන්තයට" (From lab findings to batik industry application) ප්‍රායෝගික යෙදවුමයි. විද්‍යාගාර තුළ පරීක්ෂාවට ලක් කළ වර්ණක ජාතික මෝස්තර මධ්‍යස්ථානයේ නිර්මාණ දායකත්වය සහ ප්‍රමුඛ පෙළේ බතික් ශිල්පීන්ගේ සහයෝගයෙන් නිර්මාණ සඳහා සාර්ථකව අත්හදා බැලීමට කටයුතු කරන ලදී. මෙම පර්යේෂණ ප්‍රතිඵල ලියකියවිලිවලට පමණක් සීමා නොවී කර්මාන්තකරුවා වෙත සෘජුව ගලා යාමට හැකිවන පරිදි ඉදිරියේ දී කර්මාන්තකරුවා වෙත හඳුන්වා දීමට නියමිතය. පරිසර හිතකාමී සහ සංස්කෘතිකමය අතින් ඉහළ වටිනාකමක් සහිත මෙවැනි නිෂ්පාදන හරහා දේශීය නිෂ්පාදකයන්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ "තිරසාර සන්නාමයක්" (Sustainability branding) ගොඩනගා ගැනීමට මින් මඟ විවර වේ.

රජයේ මැදිහත් වීමෙන් තැබූ මෙම ප්‍රථම පියවර මෙරට පේෂකර්මාන්තයේ හරිත අනාගතයක සුබ පෙරනිමිත්තකි.



✍ ඉන්දීවරී මනුල වික්‍රම

# දේශීය අනන්‍යතාවයෙන් වෙළෙඳපොළ ජයගත්

# TEELAN Salon Care











**වර්තමාන ශ්‍රී ලාංකේය ආර්ථිකය තුළ දේශීය නිෂ්පාදන ක්ෂේත්‍රය සවිබල ගැන්වීම ජාතික අවශ්‍යතාවයකි. එවන් වටපිටාවක ආනයනය මත පදනම් වූ කර්මාන්තයක් දේශීයකරණය කරමින්** "Made in Sri Lanka" **සන්නාමය යටතේ ජාත්‍යන්තරයට පවා පා තැබූ** Teelan Salon Care **ආයතනයේ ගමන් මඟ වර්තමාන ව්‍යවසායකයින්ට මහත් ආදර්ශයකි. මේ ඒ පිළිබඳ තැබූ කෙටි සටහනකි.**

## ■ ආරම්භය සහ පසුබිම

තම පියාගේ ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආභාසය ලබමින් වැඩපොළවල් තුළ කුඩා කල සිටම ලැබූ ප්‍රායෝගික පුහුණුව තිලාන් දුෂ්මන්තගේ ව්‍යවසායකත්ව ගමනට පදනම විය. 2018 වසරේ පෙබරවාරි 09 වන දින එක් පුටුවකින් ආරම්භ කළ මෙම Salon Furniture ව්‍යාපාරය අද වන විට සේවකයින් 60කට අධික පිරිසකට රැකියා අවස්ථා සලසන වර්ග අඩි 12,000ක නිෂ්පාදන පරිශ්‍රයකින් සමන්විත දැවැන්ත ආයතනයක් දක්වා වර්ධනය වී ඇත.

## ■ අභියෝග හමුවේ නායකත්වය සහ නවෝත්පාදනය

ඔහුගේ ව්‍යාපාරික ගමනේ දී මුහුණ දුන් දැවැන්තම අභියෝගය වූයේ කොවිඩ් වසංගතයයි. එතෙක් ක්‍රියාත්මක වූ පහසු ගෙවීමේ ක්‍රමය (Easy Payment System) අර්බුදයකට ලක් වූ මොහොතේ ඔහු සැලූන් උපකරණ ක්ෂේත්‍රයට "වර්ණ 70ක සංකල්පය" (Colors 70 concept) සහ "අභිරුචි පරිදි සකස් කිරීමේ" (Customization) සේවාව හඳුන්වා දුන්නේය. මෙය වෙළඳපොළ තුළ ඒකාධිකාරයක් පවත්වාගෙන ගිය ආනයනික කළු පැහැති සැලූන් පුටු වෙනුවට පාරිභෝගිකයාට තමන්ගේම සිහිනයට අනුව නිෂ්පාදන තෝරා ගැනීමට ඉඩ සැලසූ විප්ලවීය පියවරක් විය.

## ■ ගුණාත්මකභාවය සහ පාරිභෝගික විශ්වාසය

Teelan Salon Care ආයතනයේ සාර්ථකත්වයේ රහස වන්නේ තම Teelan Brand එක කෙරෙහි දක්වන ඇඩි අවධානයයි. වරක් අමුද්‍රව්‍යවල දෝෂයක් නිසා ඇති වූ ගැටලුවකදී තමන්ට පාඩු සිදු වුව ද පාරිභෝගිකයා වෙත නව නිෂ්පාදන ලබා දෙමින් තම විශ්වාසනීයත්වය සුරැකීමට ඔහු කටයුතු කළේය. ලංකාවේ ප්‍රථම වරට සැලූන් උපකරණ සඳහා Door-to-door warranty වගකීම ලබා දෙන්නේ ද මෙම ආයතනයයි.

## ■ දේශීය අගය එකතු කිරීම සහ විදේශ විනිමය

මෙම නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යවලින් 70% - 80%ක්ම දේශීයව සපයා ගනිමින් ඉහළ අගය එකතු කිරීමක් (Value Addition) සිදු කරයි. මාලදිවයින සහ සීෂෙල්ස් වැනි රටවලට තම නිෂ්පාදන අපනයනය කරමින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දීමට ද Teelan Salon Care ආයතනය සමත්ව ඇත.

## ■ අමාත්‍යංශයේ සහයෝගය

Teelan Salon Care ආයතනය නූතන තාක්ෂණය සමඟ බද්ධ වූ ගෝලීය මට්ටමේ ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමෙහිලා කර්මාන්ත අමාත්‍යාංශයේ මැදිහත් වීම සුවිශාල කාර්යභාරයක් ඉටු කර ඇත. විශේෂයෙන් ම අමාත්‍යාංශ ලේකම්තුමියගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන 4I ව්‍යාපෘතිය සමඟ අත්වැල් බැඳගැනීම මඟින් ලැබුණු සුවිශේෂී සහයෝගය මෙම ගමනේ හැරවුම් ලක්ෂයක් බවට පත්ව ඇත.

## ■ අනාගත දැක්ම

හුදෙක් උපකරණ අලෙවියෙන් ඔබ්බට ගොස් සැලූන් එකක් ආරම්භ කිරීමට අවශ්‍ය සැලසුම්කරණයේ සිට අභ්‍යන්තර අලංකරණය (Interior Design) දක්වා වූ පූර්ණ විසඳුම් (Full Solution) ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස මෙම ආයතනය අද වන විට පරිවර්තනය වී ඇත. "අපි නිර්මාණය කරන්නේ මිනිසුන්ගේ හීන" යන තේමාව පෙරදැරි කරගත් තිලාන් මහතාගේ නායකත්වය දේශීය කර්මාන්තකරුවන්ට සැබෑ අභිමානයකි.



**තිලාන් දුෂ්මන්ත බස්නායක**
කළමනාකාර අධ්‍යක්ෂ
Teelan සමූහ ව්‍යාපාරය

ඡායාරූපය - ශාන් රූපස්සර

✍ ඉන්දීවරී මනුල වික්‍රම

Rebuild Industries

# දේශීය සන්නාමයක පුනරුදය

## BCC




ශ්‍රී ලංකාවේ කාර්මික ඉතිහාසය තුළ සුවිශේෂ සලකුණක් තැබූ බ්‍රිතාන්‍ය ලංකා සංස්ථාව (British Ceylon Corporation) හෙවත් වර්තමානයේ BCC ලංකා ලිමිටඩ් යනු දශක කිහිපයකට පෙර මෙරට පොල්තෙල් සහ සබන් නිෂ්පාදනයේ අද්විතීය සන්නාමයයි. එහෙත් කාලයාගේ ඇවෑමෙන් අකාර්යක්ෂම පාලනය සහ යල් පැන ගිය තාක්ෂණය හමුවේ අගාධයට ඇද වැටුණු මෙම ආයතනය වසා දැමිය යුතු ආයතන ලැයිස්තුවට පවා ඇතුළත් කර තිබුණි. එහෙත් පසුගිය වසර තුළ කර්මාන්ත අමාත්‍යාංශයේ මඟපෙන්වීම සහ නව කළමනාකාරිත්වයේ කැපවීම මත BCC ලංකා ලිමිටඩ් ආයතනය සිදු කර ඇති පුනර්ජීවනය රාජ්‍ය අංශයේ බිඳ වැටුණු ආයතන ගොඩනැඟිය හැකි ආකාරය පිළිබඳව ලොවටම දෙන කදිම පාඩමකි.

### ● වසර 35කට පසු භාණ්ඩාගාරයට ලාභාංශ

මෙම පරිවර්තනයේ වඩාත්ම කැපී පෙනෙන ජයග්‍රහණය වන්නේ වසර 35ක දීර්ඝ නිහඬතාවයකින් පසු ආයතනය ලාභ ලබන තත්ත්වයට පත්වීමයි. ඒ අනුව 2025 වසරේ දී උපයාගත් ලාභයෙන් රුපියල් මිලියන 50ක මුදලක් මහා භාණ්ඩාගාරයට ලාභාංශ ලෙස ලබා දීමට BCC කළමනාකාරිත්වය සමත් විය. ආයතනය සතු දේපළවලින් උපරිම ඵල නෙලාගැනීමේ අරමුණින් මීට පෙර රුපියල් 55ක් වැනි අවම මිලකට (වර්ග අඩියක් සඳහා) කුලියට දී තිබූ ගබඩා සහ කාර්යාල පරිශ්‍රයන්හි කුලී අගය රුපියල් 100-115 දක්වා සාධාරණ ලෙස ඉහළ නැංවීමට පියවර ගෙන ඇත. මේ හරහා ආයතනයේ මූල්‍ය ශක්තිය වර්ධනය කරගනිමින් රුපියල් මිලියන 150කට අධික මුදලක් ස්ථාවර තැන්පතු ලෙස පවත්වාගෙන යමින් මූල්‍ය ස්ථාවරත්වය තහවුරු කිරීමට ද ඔවුන් කටයුතු කර තිබේ.

### ● තාක්ෂණික විප්ලවය

තාක්ෂණික අතින් ආයතනය නවීකරණය කිරීම මෙහි දෙවන සන්ධිස්ථානයයි. වතුපිටිවල කර්මාන්ත ශාලාවේ අක්‍රියව පැවති යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමත්, පොල්තෙල් පිරිපහදු කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නවීකරණය කිරීමත් හරහා නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවා ඇත. විශේෂයෙන්ම කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතන අතරින් අලෙවි අංශයේ කටයුතු පූර්ණ ලෙස ඩිජිටල්කරණය කළ ප්‍රථම ආයතනය බවට පත්වෙමින් BCC ආයතනය නව යුගයකට පා තබා ඇත. පාරිභෝගිකයාට ඉහළ ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදන ලබා දීම තහවුරු කිරීම සඳහා පැවති පැරණි රසායනාගාරය වෙනුවට නවීන පහසුකම් සහිත පූර්ණ රසායනාගාරයක් ඉදි කිරීම ද මෙහි කැපී පෙනෙන දියුණුවකි.



**ප්‍රසංග ඉන්ද්‍රජිත් පෙරේරා**
සභාපති - BCC ලංකා සමාගම

### ● වෙළෙඳපොළ ජයගත් නව නිපැයුම්

නිෂ්පාදන පෙළගැස්ම ශක්තිමත් කරමින් "BCC පහන් තෙල්" වැනි නව නිපැයුම් වෙළෙඳපොළට හඳුන්වා දීමටත්, කලක් අඩපණව තිබූ සබන් නිෂ්පාදන කටයුතු යළි සක්‍රිය කිරීමටත් බලධාරීන් කටයුතු කර තිබේ. මීට අමතරව "හෙළ බොජුන් අවන්හල" සහ "සුපිරි වෙළෙඳසැල" වැනි ව්‍යාපෘති මඟින් ආයතන පරිශ්‍රය මහජනතාවට සමීප කරවීමට ද බලාපොරොත්තු වේ. නිෂ්පාදන බෙදාහැරීමේ ජාලය ශක්තිමත් කිරීම සඳහා නව ලොරි රථ මිලදී ගැනීමත්, නව අලෙවි නියෝජිතයන් පත් කිරීමත් හරහා ලංකාව පුරාම BCC සන්නාමය ප්‍රචලිත කිරීම මේ වන විට සාර්ථකව සිදු වේ.

### ● අනාගත දැක්ම

අනාගත දැක්ම පිළිබඳව අවධානය යොමු කිරීමේ දී 2026/27 වර්ෂය සඳහා ද BCC ආයතනය සතුව දැවැන්ත සැලසුම් පවතී. ඒ යටතේ "Innovative City" වැනි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමටත්, සබන් නිෂ්පාදන පිරිවැය අවම කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන අමුද්‍රව්‍ය (Soap Noodle) සෘජුවම ආනයනය කිරීමටත් සැලසුම් කර ඇත. තවද රජය සතු පොල් වතු සංවර්ධනය කර සහනදායී මිලට පොල් ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කිරීම මඟින් පාරිභෝගිකයාට අඩු මිලට පිරිසිදු පොල්තෙල් ලබා දීමට ඔවුන් අපේක්ෂා කරයි. අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය ඔස්සේ නවීන අලෙවිකරණ ප්‍රවේශයක් ලබා ගනිමින් BCC ලංකා නාමය ජාත්‍යන්තර මට්ටමට ඔසවා තැබීම කළමනාකාරිත්වයේ එකම අරමුණයි.








✍ ඉන්දීවරී මනුල වික්‍රම

ඡායාරූප - චින්තක කුමාරසිංහ

# ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර කර්මාන්ත සහ ආයෝජන සහයෝගීතාව වර්ධනය පිළිබඳ අවධානය

නිල සංචාරයක් සඳහා දිවයිනට පැමිණ සිටි පකිස්ථානයේ කර්මාන්ත සහ නිෂ්පාදන සඳහා අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ සහකාර Haroon Akhtar Khan මහතා සහ කර්මාන්ත සහ ව්‍යවසායකත්වය සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති මහතා අතර විශේෂ සාකච්ඡාවක් ජනවාරි 28 පැවැත්විණි.



ශ්‍රී ලංකාව සහ පකිස්ථානය අතර කර්මාන්ත සහ ආයෝජන සහයෝගීතාව වර්ධනය කර ගැනීම පිළිබඳව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ අතර රසායනික නිෂ්පාදන, ඛනිජ නිෂ්පාදන, මැණික් සහ විද්‍යුත් ත්‍රීවීල් නිෂ්පාදන ක්ෂේත්‍රයන් සඳහා ඇති ආයෝජන අවස්ථාවන් පිළිබඳව Haroon Akhtar Khan මහතා ප්‍රමුඛ පකිස්ථාන නියෝජිත පිරිසේ විශේෂ අවධානය යොමු විය.





ශ්‍රී ලංකාව හා පකිස්ථානය යන රටවල් දෙකටම පොදු කර්මාන්ත ක්ෂේත්‍රයේ පවතින අභියෝග ජයගැනීම සඳහා පොදු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන ලදී.



# තිරසර ආර්ථිකයක් සඳහා උතුරු ආයෝජන සමුළුව....

ශ්‍රී ලංකාවේ තිරසර ආර්ථිකයක් සඳහා උතුරු පළාත තුළ ඇති ආයෝජන අවස්ථා පිළිබඳව දේශීය සහ විදේශීය අයෝජකයන් දැනුවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම, උතුරු පළාත දේශීය ආර්ථිකයට දක්වන දායකත්වය වැඩි කිරීම , එම පළාත තුළ රැකියා අවස්ථා ඇතිකිරීම සහ තරුණ හා කාන්තා ව්‍යවසායකත්වය දිරිගැන්වීම අරමුණු කරගනිමින් පසුගිය (ජනවාරි) 21 හා 22 යන දෙදින යාපනය තිරුවල්ලුවාර් සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවති උතුරු ආයෝජන සමුළුව (Northern Investment Summit 2026) සාර්ථකව අවසන් විය.

The Management Club විසින් සංවිධානය කළ මෙම උතුරු ආයෝජන සමුළුව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යංශය, යාපනයේ ඉන්දියානු කොන්සල් ජනරාල් කාර්යාලය, උතුරු පළාත් සභාව, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ඇතුළු රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක සහභාගීත්වයෙන් පවත්වන ලදී.

# වසාදමා වසර 40කට පසුව පරන්තන් රසායනික කම්හල නැවත ඉදිකිරීම් අරඹයි

උතුරු පළාතේ පැවැති යුදමය වාතාවරණය නිසා විනාශයට පත්ව 1985දී වසාදැමූ පරන්තන් රසායනික කර්මාන්තශාලාව වසර 40 කට පසුව නැවත ඉදිකිරීමට පසුගියදා (ජනවාරි 22) පරන්තන්හි පිහිටි රසායනික කර්මාන්ත කලාපයේදී මුල්ගල තැබීය.

මෙරට ඉදිකළ ආරම්භක කර්මාන්තශාලා අතරින් එකක් වන පරන්තන් රසායනික කර්මාන්ත ශාලාව 1954 දී උතුරු පළාතේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පරන්තන්හිදී රජයේ රසායනික කර්මාන්ත ශාලාව ලෙස ආරම්භ කරන ලද අතර 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත මගින් 1957 දී පරන්තන් රසායනික සංස්ථාව ලෙස පවත්වාගෙන යනු ලැබීය. 1985 දී වසා දැමීමට පෙර මෙහි දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරමින් ප්‍රධාන නිෂ්පාදන ලෙස කෝස්ටික් සෝඩා හා ද්‍රව ක්ලෝරීන්ද අතුරු නිෂ්පාදන ලෙස හයිඩ්‍රොක්ලෝරික් අම්ලය, සින්ක් ක්ලෝරයිඩ් සහ මේස ලුණු නිෂ්පාදනය කරන ලදි.

රුපියල් මිලියන 6900ක ආයෝජනයකින් නැවත ඉදිකරන පරන්තන් රසායනික කර්මාන්තශාලාවේ ඉදිකිරීම් වසර 2 1/2 කින් නිමකිරීමට නියමිත අතර මෙහි දේශීය වෙළඳපොළ සඳහා පොලි ඇලුමිනියම් ක්ලෝරයිඩ් (PAC) සහ හයිඩ්‍රොක්ලෝරික් අම්ලය (HCL) නිෂ්පාදනය කිරීමට නියමිත වෙයි.






**ලක්ෂ්මී ද සිල්වා**
ප්‍රවෘත්ති නිලධාරී

# Up Coming Events

Rebuild Industries

## 2026 - 02 - 20
ඌව පළාත් ව්‍යවසාය  සම්මාන උළෙල - කැපිටල් සිටි හෝටලය, බදුල්ල

## 2026 – 02 - 28
මධ්‍යම පළාත් ව්‍යවසාය සම්මාන උළෙල - ග්‍රෑන්ඩ් ගාඩින් හෝටලය, මහනුවර

## 2026 - 03 - 05
ප්‍රජා ඵලදායිතා ආදර්ශ ගම්මාන එළිදැක්වීම - කළුතර, සිවුදෙවුගම

## 2026 - 03 - 10
උතුරු පළාත් ව්‍යවසාය සම්මාන උළෙල

## 2026 - 03 - 28
"ශිල්ප අභිමානි" ජාතික හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සහ අලෙවි සල්පිල

## 2026- 03 - 30
"ශිල්ප අභිමානි" ජාතික හස්ත කර්මාන්ත ජනාධිපති සම්මාන උළෙල

## 2026 - 04 - 02
සීගිරිය හස්ත කර්මාන්ත සහ සංස්කෘතික ගම්මානය විවෘත කිරීම - සීගිරිය

- අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) – 0112 300705
- කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB) – 0112 605326
- ජාතික ශිල්ප සභාව (NCC) – 0112 788425
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC) – 0112 607814
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය (SLITA) – 0112 632406
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS) – 0112 186030
- ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය (NEDA) - 0112 368356
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) - 0112 390645
- භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) – 0112 886289
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය (SED) – 0112 2662002

| | | | | |
|---|---|---|---|---|
| කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03<br>0112 392149 / 0112 392150<br>www.industry.gov.lk | උපදේශකත්වය<br>ජේ. එම්. තිලකා ජයසුන්දර<br>ලේකම්<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | අධීක්ෂණය<br>සුභාෂිණී කුලතුංගමුදලී<br>අතිරේක ලේකම් (පාලන)<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | සම්බන්ධීකරණය<br>ලක්ෂ්මි ද සිල්වා<br>ප්‍රවෘත්ති නිලධාරී<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | LAKE HOUSE<br>Government Relations Dept.<br>රාජ්‍ය සබඳතා දෙපාර්තමේන්තුව<br>ලේක් හවුස්<br>0112 429297 /<br>077 3493785<br>අමාත්‍යාංශ නිලපුවත්පත් සඳහා විමසීම් |

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 18 වැනි ද බදාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.